**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) මෙම වාර්තාවේ ඡේද අංක 2.3(අ) මගින් දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි සඳහන් පරිදි ඒසීඒ-ඩී ආකෘතියේ "අදාළ ආකෘතියේ/ ඇමුණුමේ පිටු අංකය" ඇතුළත් කළ යුතු තීරුවේ ඒ වෙනුවට "සටහන්" යන්න යොදා එය හිස්ව තබා තිබුණු බැවින් ගිණුමේ ආකෘතීන් ඇතුළත් පිටු අංක හඳුනාගැනීමට විගණනයේ දී නොහැකි විය. | අතපසුවීමකින් එසේ ඇතුළත් කර ඇති අතර ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී අමාත්‍යාංශය විසින් බදුකුලී එකතු කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 07කින් රජයට අයවිය යුතු රු.838,042,793ක බදු ආදායම හිඟව පැවතියද, මු.රෙ.176(2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බොගවන්තලාව, මස්කෙළිය හා හලාවත වැවිලි සමාගම් 03 විසින් 2022.12.31 දිනට හිඟහිටි බදු මුදල 2023.02.28 දින වනවිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර, කැලණිවැලි හා කොටගල වැවිලි සමාගම් දෙක විසින් ද එක් කාර්තුව බැගින් ගෙවා ඇත. 2023.02.28 දිනට හිඟ බදු මුදල රු.734,063,996 කි. එම හිඟ බදු කුලිය වර්ධනය වීමට හේතු වී ඇත්තේ කොටගල වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම් දෙක විසින් ගෙවිය යුතු හිඟ බදු කුලිය හේතුවෙන්ය. | හිඟ බදු ආදායම් නියමිත දිනට අයකර ගැනීමට විධිමත් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1995 වර්ෂයේ නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන බදුකුලී සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල, වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු වුවද ශුද්ධ වත්කම් අඩුවීම මත සමාගම විසින් වසරකට ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම හේතුවෙන් 2023 පෙබරවාරි 28 දිනට රු.277,714,736ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතුව තිබෙන අතර, එයින් රු.116,801,733 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින බව නිරීක්ෂණය විය. මෙම සමාගම සමඟ ඇති කර ගෙන තිබුණු බදු සංශෝධන ගිවිසුමෙහි 2(a) ඡේදය අනුව එහි සඳහන් නියමිත දිනයන්ට අඛණ්ඩව බදු කුලිය ගෙවීම සඳහා එම සමාගම එකඟ වී තිබුණද, වසර ගණනාවක සිට එම කොන්දේසිය කඩ කර තිබුණද මෙම ගිවිසුමෙහි 5(c) ඡේදය අනුව දින 07 ක් ඇතුළත දැන්වීමක් ඉදිරිපත් කර බදු ගිවිසුම අහෝසි කළ හැකි නමුත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කුරුණෑගල වැවිලි සමාගම විසින් ඔවුන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය යටතේ අඛණ්ඩව බදු කුලිය ගෙවීම් කර ඇත. නමුත් එම සමාගමේ හිඟ බදු කුලිය වර්ධනය වී ඇත්තේ සමාගම හා ස්වර්ණමය කොටස් හිමිකරු ගණනය කරනු ලබන ක්‍රමවේදය අතර පවතින වටිනාකම් වල වෙනස මඟිනි. කුරුණෑගල වැවිලි සමාගම 100% ක් රජය සතු වැවිලි සමාගමක් වන බැවින් හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර තීරණයක් ගත යුතුව ඇත. | ගිවිසුම පරිදි බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 70 සිට සියයට 220 දක්වා ප්‍රතිශතයකින් පරිපූරක ඇස්තමේන්තු මඟින් හා මු.රෙ. 66 යටතේ මාරු කිරීම් මඟින් අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | 2022 වර්ෂයේදී භාණ්ඩාගාරය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව සමහර වැය විෂයන්හි වියදම් සීමා කිරීමට සිදුවීම මත එම වැය විෂයන්ගේ වියදම් අමාත්‍යාංශයේ පැවති අත්‍යාවශ්‍ය වූ අනෙකුත් වියදම් දැරීම සඳහා මු.රෙ.66 මඟින් මාරු කිරීම සිදු කරන ලද අතර වර්ෂය ආරම්භයේදී අප විසින් ඇස්තමේන්තු කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමට හා වෙන් කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශය වෙත අනුමත නොවීමෙන් මෙසේ මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වී ඇත. | |
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් රු.1,000,000 ක් වෙන් කර තිබුණු නමුත් අදාළ කාර්යය සඳහා යොදා නොගෙන මෙම ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන්ම මු.රෙ.66 මගින් වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා මාරු කර තිබුණි. | 2022 වර්ෂයේදී භාණ්ඩාගාරය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව සමහර වැය විෂයන්හි වියදම් සීමා කිරීමට සිදුවීම මත එම වැය විෂයන්ගේ වියදම් අමාත්‍යාංශයේ පැවති අත්‍යාවශ්‍ය වූ අනෙකුත් වියදම් දැරීම සඳහා මු.රෙ.66 මඟින් මාරු කිරීම සිදු කරන ලද අතර වර්ෂය ආරම්භයේදී අප විසින් ඇස්තමේන්තු කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත අනුමත නොවීමෙන් මෙසේ මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමට හා වෙන් කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා සලසා තිබුණු එකතුව රු.15,075,000ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 31ක් සඳහා සලසා තිබුණු එකතුව රු.90,101,000ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.35,365,035ක්**,** සියයට 27 සිට සියයට 95 දක්වා වූ සැලකිය යුතු ප්‍රමාණයන්ගෙන් ඉතිරි වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉතිරියක් පෙන්නුම් කරනු ලබන්නේ 2022 වර්ෂයේ පැවති රාජ්‍ය වියදම් කළමනාකරණය චක්‍රලේඛයට අනුව අමාත්‍යාංශයේ කටයුතුද සැලසුම් කර තිබුණු බැවින් මෙම ඉතිරියන් ඇති වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමට හා වෙන් කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 06ක් සඳහා මු .රෙ.66 යටතේ මාරුකර තිබුණු එකතුව රු.8,585,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.2,549,327 ක් අදාළ කාර්යන්හි උපයෝජනය නොකර ඉතිරි වී තිබුණු අතර මෙම ඉතිරිය එම කාර්යන් සඳහා මු.රෙ.66 යටතේ මාරුකර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 30 ක් විය. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද වියදම් කළමනාකරණය චක්‍රලේඛය අනුව අමාත්‍යාංශය විසින් වැය විෂයන් කළමනාකරණය කර අමාත්‍යාංශ කටයුතු සිදු කරන ලදී | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමට හා වෙන් කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර පොත් හා අමාත්‍යාංශ පොත් අතර පැවති රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂයෙහි රු.56,769ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙය නිරවුල් කර ගැනීමට ගතහැකි ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් තවදුරටත් ලිපි ගොනු පරීක්ෂා කරමින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | වෙනසට හේතු හඳුනා ගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයෙන් බැහැරට ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.36,116ක ණය ශේෂයක් අවුරුදු 28ක පමණ කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම නිලධාරියා පිළිබඳ කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි වූ බැවින් මෙම ණය ශේෂය අතහැරීමට නිර්දේශය ලැබී ඇති අතර ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |
| (ඇ) | සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් වසර 13ත් 25ත් අතර කාලයක සිට අයවිය යුතු එකතුව රු.398,511ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් වී නොතිබුණි. | වැඩ තහනම් කර ඇති නිලධාරියාගේ ණය නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. සේවය හැරගිය නිලධාරීන් ගෙන් එක් නිලධාරියෙක් මිය ගොස් ඇති බැවින් මෙම ණය ශේෂය අතහැරීමට නිර්දේශය ලැබී ඇති අතර ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතී. අනිත් නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග සිදුකරනු ඇත. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |
| (ඈ) | විශ්‍රාමික නිලධාරියකුගෙන් අයවිය යුතු රු.133,569 ක් අවුරුදු 02 ක් ගතවී තිබුණද අයකර ගෙන නොතිබුණි. | නිලධාරියාගේ පාරිතෝෂිකයෙන් පියවා ගැනීමට කටයුතු කරනු ඇත. | විශ්‍රාමික නිලධාරීන්ගේ ණය පාරිතෝෂිකයෙන් අය කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ පෞද්ගලික අංශය නියෝජනය කරන ශ්‍රී ලංකා රබර් කර්මාන්ත සංගමය සමඟ එක්ව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහය සමඟ සකස් කරන ලද දස වසරක (2016-2025) රබර් කර්මාන්ත ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජූලි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අනුමැතිය ලබා දී ව්‍යාපෘති 25ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද ශ්‍රී ලංකා රබර් මහ ලේකම් කාර්යාලය ස්ථාපිත කර ව්‍යාපෘති 06ක් පමණක් ක්‍රියාත්මක කර ව්‍යාපෘති 19ක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත අරමුණු ඉටු කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. එසේම ස්ථාපිත කළ ශ්‍රී ලංකා රබර් මහ ලේකම් කාර්යාලයට බඳවා ගත් ප්‍රධාන තනතුරු වන මහ ලේකම්, ව්‍යාපෘති කළමනාකරණ විශේෂඥ හා ව්‍යාපෘති ලේකම් ඇතුළු සියලු සහායක තනතුරු වල නිලධාරීන් රැකියාවේ අස්ථිරභාවය, තනතුරු සඳහා බඳවා ගැනීම හා අනුමත කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් අදාළ තනතුරු වලින් ඉවත්වී තිබුණි. | 2016 වර්ෂයේදී හඳුනාගත් ව්‍යාපෘති වර්තමානයට නොගැළපීම හා ශ්‍රී ලංකාව තුළ පවතින වත්මන් ආර්ථික තත්ත්වය යන හේතු කාරණා පදනම් කොටගෙන රබර් මහා සැලැස්මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව ගැටලු සහගත වූ බැවින් 2023.01.18 වන දින රබර් මහා සැලැස්ම සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශයේ දී සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරමින් පවතී. | ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම හා ඵලදායී විය යුතුය. |

### 3.2 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභ හානි සිදු වී වර්ෂ 06 ත් වර්ෂ 11 ත් අතර කාලයක් ගත වී ඇති සිද්ධීන් 06 ක් සම්බන්ධයෙන් එකතුව රු.5,221,961ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි | මුදල් රෙගුලාසි අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර පාඩු හා හානි අයකර ගැනීමට සහ අය කරගත නොහැකි නම් කපා හැරීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලය 826ක් වූ අතර නිලධාරීන් 91ක පුරප්පාඩු හා 22ක අතිරික්තයක් පැවතුණ ද මෙම ඌනතා හා අතිරික්තතා සඳහා විධිමත් පියවරක් ගැනීමට හෝ කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්තව සිටින නිලධාරින් නම් කර, එම නිලධාරින්ට සුදුසු පරිදි ස්ථාන මාරු ලබා දීමට කටයුතු කරමින් පවතී. එසේම පුරප්පාඩු සඳහා අමාත්‍යාංශය මඟින් බඳවා ගැනීම් කළ නොහැකි බැවින් අදාළ පුරප්පාඩු පිරවීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතුය. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට ක්‍රියා කළ යුතුය. |